# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 14,499—1965 සැප්තැම්බර් 7 වැනි අඟහරුවාදා—1965.9.7**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### නිවේදනය

1946 සහ 1947 ලංකා (ආණ්ඩු ක්‍රම හා ස්වාධීනතා) රාජසභා නියෝගවල 46 (4) වෙනි ඡේදයේ විධිවිධාන යටතේ, මේ නිවේදනයේ සඳහන් දින සිට "1944 අංක 28 දරණ විහාර සන්තක භූමි වන්දි ආඥාපනත—3 (1) හා 3 (3) වගන්ති" සහ "විහාර දේවාලගම්" පිළිබඳ විෂයයන් අධිකරණ ඇමති තුමා වෙත මවිසින් පවරා ඇති බවත්, ඒ අනුව, ඉහත සඳහන් ඡේදය යටතේ කරනු ලැබ අංක 14,363 හා 1965 මාර්තු 27 වැනි දින දරණ අති විශෙෂ ගැසට් පත්‍රය මගින් පළකර අංක 14,389 හා 1965 මැයි 6 වැනි දින, 14,413 හා 1965 ජූනි 1 වැනි දින හා 14,454 හා 1965 ජූලි 16 වැනි දින දරණ අති විශෙෂ ගැසට් පත්‍රවල පසුව පළකරන ලද නිවේදන මගින් සංශෝධනය කරන ලද නිවේදනය පහත සඳහන් පරිදි එනම් :—

(අ) "ස්වදේශ කටයුතු ඇමති" යන ශීර්ෂය යටතේ "විෂයයන් හා කාර්‍ය්‍යයන්" ට අදාල තීරයේ සඳහන් "1944 අංක 28 දරණ විහාර සන්තක භූමි වන්දි ආඥාපනතේ 3 (1) සහ 3 (3) වැනි වගන්ති" හා "විහාර දේවාලගම්" යන වචන අතහැරීමෙන්ද ;

(ආ) "අධිකරණ ඇමති" යන ශීර්ෂය යටතේ "විෂයයන් හා කාර්‍ය්‍යයන්" ට අදාල තීරයේ සඳහන් "මහා භාරකාරකැන" නමැති උප ශීර්ෂය යටතේ වූ කරුණුවලට පසුව පහත සඳහන් එනම්,

"1944 අංක 28 දරණ විහාර සන්තක භූමි වන්දි ආඥාපනත—3 (1) හා 3 (3) වගන්ති"

"විහාර දේවාලගම්" යන කරුණු ඇතුළත් කිරීමෙන්ද,

තවදුරටත් සංශෝධනය කරන බවත්, මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩඩ්ලි සේනානායක,
අග්‍රාමාත්‍ය.

අග්‍රාමාත්‍ය කාර්‍ය්‍යාලය,
කොළඹ,
1965 සැප්තැම්බර් 7 වැනි දින.
9–545


ලංකාවේ වැලිවේරියෙහි පිහිටි "රිජ්වේ පේපර් මිල්ස් කෝර්පරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි

1313 —— ආර් 8626—6,475 (65/9)